සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

| | |
|---|---|
| **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** | **I, II** |
| தொடர்பாடலும் ஊடகக் கல்வியும் | **I, II** |
| Communication and Media Studies | **I, II** |

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

- ※ **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- ※ **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

1. "ගුවනින් ගමනක් යන්න ලැබුණොත්" මැයෙන් නීලා ලියූ රචනාව 'ඉදිරිය' ළමා පුවත්පතෙහි පළව ඇති බව විදුහල්පතිතුමා උදැසන රැස්වීමේ දී සතුටින් ප්‍රකාශ කළේ ය.

   (i) ඉහත තේමාවට අනුව රචනාව ලිවීමට නීලාට උදව් වී ඇත්තේ කුමන සන්නිවේදන වර්ගය ද?

   (ii) 'රචනාව' අයත් වන ප්‍රධාන සන්නිවේදන ස්වරූපය කුමක් ද?

   (iii) පුවත්පත අයත් වන සන්නිවේදන වර්ගයට අදාළ තවත් වාරානුකූල ව ප්‍රකාශයට පත් වන මාධ්‍යයක් නම් කරන්න.

   (iv) විදුහල්පතිතුමා සම්බන්ධ වන සන්නිවේදන වර්ගය කුමක් ද?

   (v) 'තේමාව' හැඳින්වීමට පුවත්පත් වාර්තාවක දී භාවිත කරනු ලබන යෙදුම කවරේ ද?

   (vi) පුවත්පතක අන්තර්ගතය විවිධ ආකෘති අනුව ඉදිරිපත් කෙරේ. ඉහත ලිපිය අයත් වන්නේ ඉන් කුමන ආකෘතියට ද?

   (vii) ඉහත ලිපිය පළ කරන ලද්දේ ලංකා රජයට හිමි පුවත්පතක නම් ඒ ආයතනය කුමක් විය හැකි ද?

   (viii) මෙම ලිපිය ඇසුරෙන් ඉදිරියේ දී ගුවන් විදුලි වැඩසටහනක් නිර්මාණය කිරීමට නීලා අදහස් කරයි. එහි දී ඇයට භාවිතයට ගත හැකි ශබ්ද ප්‍රයෝග **දෙකක්** යෝජනා කරන්න.

   (ix) පන්තිකාමරවල ප්‍රදර්ශනය කිරීම සඳහා නීලාගේ පුවත්පත් ලිපිය ඡායා පිටපත් කොට ගුරු මණ්ඩලය වෙත බෙදා දෙන ලදී. මේ සඳහා ඔවුන්ට භාවිත කළ හැකි ප්‍රක්ෂේපනීය **නොවන** මාධ්‍ය උපකරණ **දෙකක්** නම් කරන්න.

   (x) මාධ්‍ය භාවිතයේ දී නීලා සිය පරිකල්පනය අපූරු ලෙස භාවිත කරන බව විදුහල්පතිතුමා ප්‍රකාශ කර තිබුණි. 'පරිකල්පනය' යන්න සැකෙවින් පැහැදිලි කරන්න.

   (ලකුණු 2 × 10)

WWW.OLEVELAPI.COM

2. අමරා තම පාසල් මිතුරියක වන ලක්ෂ්මීට දුරකථනයෙන් කථා කොට තමාට මඟහැරුණු ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක සහිත පාඩමක් පිළිබඳ තරුණු විමසා සිටියා ය.

   (i) ගුවන්විදුලි දුරකථන සංවාද වැඩසටහන් ආකෘතියේ විශේෂතා **දෙකක්** නම් කරන්න.

   (ii) ද්විපුද්ගල සන්නිවේදනයේ අවශ්‍යතාව පිළිබඳව කරුණු **දෙකක්** ඔස්සේ පැහැදිලි කරන්න.

   (iii) දුරකථනය ඔස්සේ සම්බන්ධ වන දෙපාර්ශ්වය විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම **තුනක්** විස්තර කරන්න.

   (iv) පාඩමට අදාළ තොරතුරු ලබා දීම සඳහා ලක්ෂ්මී විද්‍යුත් තැපෑල භාවිත කළේ නම් ලබා ගත හැකි වාසි **හතරක්** පිළිබඳ විස්තර කරන්න.

3. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්හි ආකෘතිය හා අන්තර්ගතය විවිධාකාර ය.

   (i) රූපවාහිනී ටෙලි නාට්‍ය තුළ ස්ත්‍රිය හා පුරුෂයා නිරූපණය වන ආකාරය අධ්‍යයනය සඳහා වැදගත් වන සංකල්පය කුමක් ද?

   (ii) කොටස් මත පදනම් ව රූපවාහිනී ටෙලි නාට්‍ය වර්ග කළ හැකි ආකාර **දෙකක්** විස්තර කරන්න.

   (iii) ගුවන්විදුලිය සඳහා පිටපත් රචනා කිරීමේ දී සපුරාලිය යුතු කොන්දේසි **තුනක්** විස්තර කරන්න.

[හයවැනි පිටුව බලන්න.

EXAMRESULTS.LK

(iv) නූතන රූපවාහිනී වෙළෙඳ ප්‍රචාරණයේ බලපෑම පිළිබඳ පහත සඳහන් කරුණු ඇසුරෙන් සාකච්ඡා කරන්න.

A - භාණ්ඩ හා සේවා පිළිබඳ දැනුවත් කිරීම

B - ව්‍යාපාරික අනුග්‍රාහකත්වය මත යැපීම

C - මහා පරිමාණ වෙළෙඳ ප්‍රචාරණය හා නව පාරිභෝගික සංස්කෘතිය

D - විචාරශීලී ග්‍රාහකත්වයේ වැදගත්කම

**4.** සන්නිවේදනය තොරතුරු 'ගනුදෙනුවක්' ලෙස හඳුන්වයි.

(i) නූතන තොරතුරු ගනුදෙනුවල දී භාවිත විද්‍යුත් පුවත්පත්වල පොදු ලක්ෂණ **දෙකක්** දක්වන්න.

(ii) තම ව්‍යාපාරික ස්ථානය සඳහා සංවෘත පරිපථ රූපවාහිනී කැමරා භාවිත කිරීමට හිමිකරු අදහස් කරයි. මෙමගින් ලැබෙන වාසි **දෙකක්** විස්තර කරන්න.

(iii) ජන මාධ්‍යයෙන් ඉදිරිපත් කරන තොරතුරු ළමයාගේ සමාජ ජීවිතය කෙරෙහි කරනු ලබන බලපෑම පිළිබඳ කරුණු **තුනක්** යටතේ විස්තර කරන්න.

(iv) පහත කරුණු අතුරෙන් **දෙකක්** තොරතුරු වාර්තා කිරීමේ දී වැදගත් වන ආකාරය විස්තර කරන්න.

(a) නිවැරදි බව

(b) සමතුලිත බව

(c) පැහැදිලි බව

(d) විශ්වසනීයත්වය

**5.** (i) මෘදු පුවත් යනු මොනවා ද?

(ii) රාජ්‍ය මාධ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ කළමනාකරණය පිළිබඳ තීරණ ගැනීමට සම්බන්ධ වන පාර්ශ්ව **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.

(iii) රාජ්‍ය මාධ්‍ය ආයතන ප්‍රධානියෙකුට සිය රාජකාරි කටයුතුවල දී තොරතුරු වැදගත් වන අවස්ථා **තුනක්** විස්තර කරන්න.

(iv) ජනමාධ්‍ය, සමාජය කෙරෙහි ධනාත්මක ව හා ඍණාත්මක ව බලපෑම් කරන ආකාරය පිළිබඳ පහත සඳහන් අවස්ථා ඇසුරින් වෙන වෙනම පැහැදිලි කරන්න.

A - පරිභෝජන රටාව

B - රස වින්දනය

**6.** ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන ප්‍රභා පසුගිය ජනාධිපතිවරණයේ දී තමන්ගේ කුළුදුල් ඡන්දය භාවිත කරන ලදී.

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු සතු ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(ii) ජනාධිපතිවරණයක දී ප්‍රචාරණය සඳහා භාවිත කිරීමට සුදුසු රූපවාහිනී වැඩසටහන් ප්‍රභේද **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.

(iii) මැතිවරණ වේදිකාවක අපේක්ෂකයකු සිදු කරන කතාවක් ආවරණය කිරීමේ දී අංකිත හෙවත් ඩිජිටල් ඡායාරූපකරණය වඩා උචිත ය. එයට හේතු **තුනක්** විස්තර කරන්න.

(iv) මැතිවරණ කණ්ඩායම් රැස්වීම්වල දී භාවිත කිරීමට සුදුසු ප්‍රක්ෂේපණීය නොවන උපකරණ **හතරක** යෝග්‍යතාව පැහැදිලි කරන්න.

**7.** (i) නිර්වාචික සන්නිවේදනය යනු කුමක් ද?

(ii) නිර්වාචික ලෙස තොරතුරු ලබා දීමට ලිඛිත සන්නිවේදනයේ දී භාවිත කරන විධි ක්‍රම **දෙකක්** නම් කරන්න.

(iii) ජනමාධ්‍යවල ඇතුළත් තොරතුරු විනිවිද දැකිය හැක්කේ විචාරශීලී ග්‍රාහකයකුට පමණි. එවැනි ග්‍රාහකයකු සතු ගුණාංග **තුනක්** පැහැදිලි කරන්න.

(iv) තොරතුරු නිර්මාණාත්මක ව සන්නිවේදනය කිරීමේ දී යොදා ගන්නා පහත ප්‍රකාශන විධි නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

(1) දෘශ්‍ය ප්‍රකාශන විධි

(2) ශ්‍රව්‍ය ප්‍රකාශන විධි

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II
Communication and Media Studies I, II

2019.12.06 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** "දුම්රිය කවුළුවෙන් ඈත පෙනෙන කඳු පන්තිය සුන්දර ය. එයින් සිතට ප්‍රබෝධයක් දැනේ." මෙම ප්‍රකාශය අදාළ වන්නේ,
(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයට ය. (2) පුද්ගලාන්තර සන්නිවේදනයට ය.
(3) සමූහ සන්නිවේදනයට ය. (4) ජන සන්නිවේදනයට ය.

**2.** ශ්‍රී ලංකාවේ පළමු පුවත්පත වන්නේ,
(1) ලංකාලෝකය ය. (2) කලම්බු ජර්නල් ය.
(3) උදය තාරකි ය. (4) ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය ය.

**3.** දෘඪ පුවත් බොහෝ විට දක්නට ලැබෙන්නේ පුවත්පතෙහි,
(1) මුල් පිටුවේ ය. (2) මැද පිටුවේ ය.
(3) අග පිටුවේ ය. (4) තෝරාගත් පිටුවක ය.

**4.** පාසල් විවිධ ප්‍රසංගය පිළිබඳ ව ගම්වැසියන් දැනුවත් කිරීම සඳහා වඩාත් සුදුසු සමූහ සන්නිවේදන ක්‍රමය වන්නේ,
(1) පෞද්ගලික ලිපි මගින් දැනුම් දීමයි.
(2) දිනපතා පුවත්පතක දැන්වීමක් පළකිරීමයි.
(3) ගෙන් ගෙට ගොස් අත් පත්‍රිකා බෙදා හැරීමයි.
(4) ජංගම ශබ්ද විකාශන රථයක් යොදා ගැනීමයි.

**5.** ගුවන්විදුලි මාධ්‍ය සතු දුබලතාවක් වන්නේ,
(1) ක්ෂණික මාධ්‍යයක් වීමයි. (2) එසැනින් අසන්නන් වෙත යොමු වීමයි.
(3) භූගෝලීය බාධක විරල වීමයි. (4) ශබ්ද පාදක මාධ්‍යයක් වීමයි.

**6.** සන්නිවේදනය පිළිබඳ ගණිතමය ආකෘතිය ඉදිරිපත් කිරීමට දායක වූ අයෙක් වන්නේ මේ අය අතුරෙන් කවරෙක් ද?
(1) එඩ්වඩ් හාපර් (2) වොරන් වීවර්
(3) හියු ක්ලිෆර්ඩ් (4) හැරල්ඩ් ඩී. ලැස්වෙල්

**7.** අවාචික සන්නිවේදනයට නිදසුනක් වන්නේ,
(1) ගීතයක් ගායනා කිරීමයි. (2) ධර්ම දේශනාවක් පැවැත්වීමයි.
(3) පුවත්පතක ශීර්ෂ පාඨයයි. (4) හෝඩියක අකුරු කියවීමයි.

[දෙවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

8. ප්‍රවෘත්ති වාර්තාවට අදාළ සිද්ධියෙහි සමස්ත සාරාංශය ඇතුළත් වන්නේ එහි,
(1) දේහයේ ය. (2) මුල පාඨයේ ය. (3) අවසානයේ ය. (4) ශීර්ෂ පාඨයේ ය.

9. ගුවන්විදුලි මාධ්‍යය තුළ 'එක්වරක් පමණක් ශ්‍රවණය වීමේ' දුබලතාව මගහරවා ගනිමින් පිටපතක් රචනා කිරීමේ දී **නොකළ** යුතු කාර්යයක් වන්නේ,
(1) වාක්‍ය අවසන් කිරීමේ දී විරාම ලකුණු සටහන් කිරීමයි.
(2) තාක්ෂණික උපදෙස් පිටපතෙහි ඇතුළත් කිරීමයි.
(3) තාක්ෂණික බස්වහරක් භාවිත කිරීමයි.
(4) කෙටි යෙදුම් භාවිතයෙන් වැළකී සිටීමයි.

10. එක් අයෙකු කේන්ද්‍ර කොටගෙන වැඩි දෙනෙක් වෙත පණිවිඩය පැතිර යන විධිමත් සන්නිවේදන ආකෘතිය කුමක් ද?
(1) චක්‍රීය (2) දාම (3) වයි (Y) (4) රෝද

11. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ආරම්භ වූයේ කිනම් වර්ෂයේ ද?
(1) 1976 (2) 1979 (3) 1980 (4) 1982

12. ශ්‍රී ලංකාවේ මාධ්‍ය භාවිතයට අදාළ ආචාරධර්ම පද්ධතියක් නිර්මාණයට අදාළ පනතක් වන්නේ,
(1) තොරතුරු දැනගැනීමේ පනතයි. (2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතයි.
(3) බුද්ධිමය දේපළ පනතයි. (4) රඟුම් පාලක මණ්ඩල පනතයි.

13. පරිගණකය ආධාරයෙන් තොර ව පන්ති කාමරය තුළ දී භාවිතයට ගත හැකි ප්‍රක්ෂේපණ මාධ්‍ය උපකරණයක් වන්නේ,
(1) අන්තර් ක්‍රියාකාරී පුවරුවයි. (2) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
(3) පිටු පෙරළනයයි, (4) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.

14. පාසල් වර්ණ ප්‍රදානයේ දී ලබාගත් ඡායාරූපයක් කැමරා තිරයේ ඉතා පැහැදිලි ව දිස් වුව ද එය පරිගණක තිරයේ නැරඹූ විට අපැහැදිලි බවක් පෙනුණි. එයට බලපෑ හැකි හේතුව වන්නේ,
(1) විභේදන බලය අඩු වීමයි. (2) නාභනය නිවැරදි නොවීමයි.
(3) ද්වාර වේගය අඩු වීමයි. (4) පටල වේගය වැඩි වීමයි.

15. ඡායාරූපයක අනාවරණ ක්‍රියාවලියේ දී ආලෝකය පාලනය කිරීම සම්බන්ධ ව මූලික වශයෙන් බලපාන්නේ,
(1) කැමරා කෝණයයි. (2) ක්ෂේත්‍ර ගැඹුරයි. (3) රූප සංරචනයයි. (4) ද්වාර වේගයයි.

16. මාධ්‍ය යනු කර්මාන්තයකි. එහි මූලික ලක්ෂණයක් වන්නේ,
(1) අලෙවියෙන් පසු සේවා සැපයීමයි. (2) ග්‍රාහක මතවලට අනුව සංදේශ සැකසීමයි.
(3) ලාභාංශ ග්‍රාහකයන් අතර බෙදා දීමයි. (4) උපසංස්කෘති පිළිබඳ සැලකිලිමත් වීමයි.

17. ස්ත්‍රී පුරුෂ සමාජභාවය නැමැති සංකල්පය,
(1) සාම්ප්‍රදායික වූවකි. (2) සමාජ විද්‍යාත්මක වූවකි.
(3) ජීවවිද්‍යාත්මක වූවකි. (4) මනෝවිද්‍යාත්මක වූවකි.

18. ජනමාධ්‍ය ආයතනයක හිමිකම නියෝජනය වන්නේ,
(1) ජනමාධ්‍යකරුවන්ගෙනි. (2) මහජනතාවගෙනි.
(3) දැන්වීම්කරුවන්ගෙනි. (4) අධ්‍යක්ෂවරුන්ගෙනි.

WWW.OLEVELAPI.COM

19. ස්වාධීන රූපවාහිනී සේවය ක්‍රියාත්මක වන්නේ,
(1) රාජ්‍ය සමාගමක් ලෙසිනි. (2) රාජ්‍ය සංස්ථාවක් ලෙසිනි.
(3) පෞද්ගලික නාලිකාවක් ලෙසිනි. (4) මහජන සංවිධානයක් ලෙසිනි.

20. පුවත්පත් අන්තර්ගතයේ ප්‍රධාන කොටස් වන්නේ,
(1) ප්‍රවෘත්ති, විශේෂාංග හා වෙළෙඳ දැන්වීම් ය. (2) ප්‍රවෘත්ති, සංස්කාරක වැකිය හා ඡායාරූප ය.
(3) ප්‍රවෘත්ති, කාටූන් හා වෙළෙඳ දැන්වීම් ය. (4) ප්‍රවෘත්ති, තීරු ලිපි හා කාටූන් ය.

21. ඔබ පුස්තකාලයේ කියවීම් ශාලාවේ පොතක් බලමින් සිටින අතර ඔබගේ හඬ නිහඬ කළ (Silent mode) ජංගම දුරකථනයට සමීපතමයෙකුගෙන් ඇමතුමක් ලැබුණි. එවැනි අවස්ථාවක වඩාත් යෝග්‍ය ප්‍රතිචාරය විය යුත්තේ,
(1) ඇමතුම එම මොහොතේම ලබා ගැනීමයි.
(2) ඇමතුම ලබා නොගෙන විසන්ධි වීමට හැරීමයි.
(3) ඇමතුම ලබාගෙන කාර්යබහුල බව පැවසීමයි.
(4) ඇමතුම ලබා ගැනීමට කියවීම් ශාලාවෙන් ඉවතට යාමයි.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**22.** ලබාගත් ඡායාරූපයක් ඒ මොහොතේම නැරඹීමට හැකියාව ලැබෙන්නේ,
(1) අංකිත ඡායාරූපකරණයේ දී ය.
(2) රසායනික ඡායාරූපකරණයේ දී ය.
(3) ඡායාරූපයේ ගොනු ආකෘතිය මගිනි.
(4) ඒකකාච කැමරා (SLR) ඡායාරූපයක් මගිනි.

**23.** නිවැරදි බව + සමතුලිත බව + පැහැදිලි බව = විශ්වසනීයත්වය
ප්‍රවෘත්ති වාර්තාකරණය පිළිබඳ ඉහත සමීකරණය ඉදිරිපත් කරන ලද්දේ,
(1) චාල්ස් ඩානා ය.
(2) පෝල් ඩී. මැසෙනියර් ය.
(3) මිල්ටන් බුෂ් ය.
(4) ගේබ්‍රියෙල් ස්කේද් ය.

**24.** පාසලේ සිදු කෙරෙන රුක්රෝපණ වැඩසටහනක් පිළිබඳ එම ස්ථානයට ගොස් ගුවන් විදුලි විකාශය තුළින් තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා සංජීවට උපදෙස් ලැබෙයි. මෙම ගුවන් විදුලි වැඩසටහන අයත්වන ආකෘතිය කුමක්ද?
(1) නිවේදන
(2) සජීවී විස්තර ප්‍රචාර
(3) වාර්තා කථන
(4) ප්‍රවෘත්ති

**25.** බුද්ධිමය දේපළ පනත මගින් නිර්මාපකයකු සතු දෙආකාරයක අයිතිවාසිකම් ආරක්ෂා කෙරේ. ඒවා නම්,
(1) ආර්ථික හා සමාජීය අයිතිවාසිකම් ය.
(2) සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් ය.
(3) සංස්කෘතික හා සදාචාරාත්මක අයිතිවාසිකම් ය.
(4) සදාචාරාත්මක හා ආර්ථික අයිතිවාසිකම් ය.

**26.** ප්‍රකාශනයක පිටු අංක කිරීම, පටුන සම්පාදනය, මුල් පිටු හා අවසාන පිටු සැකසීම හා පිටකවරය සැකසීම වැනි කාර්යයන් අදාළ වන්නේ,
(1) ප්‍රකාශනයේ නිමි කටයුතුවලට ය.
(2) අකුරු යෝජනය හා පිටු සැකසීම් කිරීමට ය.
(3) අත් පිටපත් සැකසීමේ ක්‍රියාවලියට ය.
(4) මුද්‍රණය හා පිටපත්කරණයට ය.

**27.** විනිවිදක පත්‍ර භාවිත කළ හැකි ප්‍රක්ෂේපණ උපකරණයක් වන්නේ,
(1) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
(2) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
(3) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
(4) අන්තර් ක්‍රියාකාරී පුවරුවයි.

**28.** ජනමාධ්‍ය ආයතන ක්‍රියාකාරිත්වය කෙරෙහි රජයේ වගකීමක් **නොවන්නේ** පහත ඒවායින් කුමක් ද?
(1) හදිසි අවස්ථාවල දී ප්‍රවෘත්ති හා සංදේශ වාරණයයි.
(2) නියාමනයන් යටතේ මාධ්‍ය ආයතන සඳහා බදු පැනවීමයි.
(3) මාධ්‍ය ක්‍රියාකාරිත්ව කෙරෙහි හැම විට සෘජුව මැදිහත් වීමයි.
(4) රාජ්‍ය අකාර්යක්ෂමතා පිළිබඳ ජනතාව දැනුවත් කිරීමයි.

**29.** දේශපාලනඥයකු රැස්වීමක් අමතන අවස්ථාවේ සවන් දෙමින් සිටි පිරිස අතුරෙන් ඔල්වරසන් හඬ ඇසුණි. සවන් දෙමින් සිටි පිරිස නියෝජනය කරන ආචාචික සන්නිවේදන 'අවකාශය' කුමක් ද?
(1) සමාජීය අවකාශය
(2) පෞද්ගලික අවකාශය
(3) සහෘද අවකාශය
(4) පොදු අවකාශය

**30.** 'මුද්‍රිත ලිපියක්' ඒ ආකාරයෙන් ම විදේශීය රටකට වේගයෙන් ම යැවිය හැකි විධික්‍රමය වන්නේ,
(1) ෆැක්ස් යන්ත්‍රය මගිනි.
(2) විද්‍යුත් තැපැල මගිනි.
(3) ලිපියක් මගිනි.
(4) ජංගම දුරකථනය මගිනි.

WWW.OLEVELAPI.COM

**31.** මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වන වගන්තියෙහි අන්තර්ගත අයිතිවාසිකම් කිහිපයක් පහත දැක්වේ.
A - තම නිදහස් මතය දැරිය හැකි ය.
B - තම නිදහස් මතය ප්‍රකාශ කළ හැකි ය.
C - දේශ සීමා නො සලකා කවර මාධ්‍යයකින් හෝ තොරතුරු ලැබීමට හා දීමට හැකි ය.
ඉහත තත්ත්වය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1978) 14(1) (අ) අනු ව්‍යවස්ථාව හා සැසඳීමේ දී සමානතාවක් දක්වන්නේ,
(1) A සමග පමණකි.
(2) B සමග පමණකි.
(3) C සමග පමණකි.
(4) A හා B සමග පමණකි.

**32.** උදැල්ලක් අලෙවි කිරීමේ අරමුණින් නිෂ්පාදිත වෙළෙඳ දැන්වීමක ගොවි මහතෙකු කුඹුරේ වැඩ කරද්දී ගෙවිලිය ඇඹුල රැගෙන පැමිණෙන ආකාරය නිරූපණය විය. මෙම අවස්ථාව අධ්‍යයනය කිරීමට වඩාත් සුදුසු සංකල්පය වන්නේ,
(1) වාර්ගිකත්වය ය.
(2) ස්ත්‍රී පුරුෂ සමාජභාවය ය.
(3) පුරවැසිභාවය ය.
(4) මානව හිමිකම් ය.

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**33.** නව මාධ්‍යයේ ස්වභාවය පිළිබඳ **අවම** අදාළත්වයක් සහිත ප්‍රකාශය තෝරන්න.
(1) එහි භූගෝලීය සීමා නොමැත.
(2) එය ගෝලීය ව්‍යාප්තියක් සහිත ය.
(3) අංකිත මාධ්‍ය උපකරණ භාවිත කරයි.
(4) සියලු ග්‍රාහකයන්ට එක ම සංදේශය ලැබේ.

**34.** ඡායාරූපකරණයේ දී පෞද්ගලික දෘෂ්ටිය එක් කිරීමට හැකි වන්නේ,
(1) ජනමාධ්‍යවේදියෙකු ප්‍රවෘත්ති ඡායාරූපයක් ලබා ගැනීමේ දී ය.
(2) රක්ෂණ නියෝජිතයෙකු වාහන අනතුරක් ඡායාරූපගත කිරීමේ දී ය.
(3) පොලිස් නිලධාරියෙකු අපරාධ ස්ථානයක් ඡායාරූපගත කිරීමේ දී ය.
(4) ඡායාරූප ශිල්පියෙකු ප්‍රදර්ශනයක් සඳහා ඡායාරූප ලබා ගැනීමේ දී ය.

- රූපයේ දක්වා ඇත්තේ පුවත්පතක ප්‍රවෘත්ති වාර්තාකරණය හා සම්බන්ධ යටිකුරු පිරමීඩයයි. එම රූපය ඇසුරෙන් ප්‍රශ්න අංක **35** හා **36** ට පිළිතුරු සපයන්න.




**35.** මෙම පිරමීඩයෙහි ප්‍රවෘත්තියට අදාළ 5WH හා සම්බන්ධ කරුණු අන්තර්ගත විය යුත්තේ,
(1) B හි ය. (2) C හි ය.
(3) A හා B හි ය. (4) B හා C හි ය.

**36.** පුවත්පතෙහි ඉඩ පිළිබඳ ගැටලුවක දී සංස්කාරකවරයා විසින් ඉවත් කිරීමට බොහෝ සෙයින් ඉඩ ඇත්තේ,
(1) B ය. (2) C ය. (3) A හා B ය. (4) B හා C ය.

**37.** හැරල්ඩ් ඩී. ලැස්වෙල් සන්නිවේදන ආකෘතියේ දැක්වෙන ප්‍රධාන අංග පහ අතුරෙන් සන්නිවේදකයා හැරුණු විට සෙසු අංග අනුපිළිවෙළින්,
(1) මාධ්‍ය, සංදේශය, බලපෑම හා ග්‍රාහකයා වේ. (2) බලපෑම, ග්‍රාහකයා, මාධ්‍ය හා සංදේශය වේ.
(3) සංදේශය, මාධ්‍ය, ග්‍රාහකයා හා බලපෑම වේ. (4) සංදේශය, ග්‍රාහකයා, මාධ්‍ය හා බලපෑම වේ.

**38.** දේශනයක් පැවැත්වීම සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) එය වාචික සන්නිවේදන අවස්ථාවකට නිදසුනකි.
(2) එහි අවාචික සන්නිවේදන අවස්ථා දැකිය හැකි ය.
(3) උච්චාරණය සෑම විටම වාචික සන්නිවේදනයට අයත් වූවකි.
(4) අවාචික සන්නිවේදනය මගින් වාචික සන්නිවේදනය ශක්තිමත් වේ.

**39.** රූපවාහිනී ටෙලි නාට්‍යවල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A - අඩු වියදමකින් වැඩි කොටස් ගණනක් නිර්මාණය වීම
B - නිෂ්පාදන කටයුතු අවසන් වීමට පෙර විකාශය ආරම්භ වීම
C - චිත්‍රාගාර තුළ පමණක් රූපගත කිරීම
D - කොටසින් කොටස කතාවේ තේමාව වෙනස් වීම
ඉහත ලක්ෂණ අතුරින් රූපවාහිනී මෙගා නාට්‍ය පෙන්නුම් කරන ලක්ෂණ අන්තර්ගත වන්නේ,
(1) A හා B හි ය. (2) A හා D හි ය. (3) B හා C හි ය. (4) C හා D හි ය.

WWW.OLEVELAPI.COM

**40.** පහත දැක්වෙන්නේ මීනා සම්බන්ධ ප්‍රකාශ තුනකි.
A - මීනා සිය විලාසිතා තෝරා ගන්නේ රූපවාහිනියේ වැඩසටහන් ඇසුරිනි.
B - රාත්‍රියේ විකාශය වන රියැලිටි වැඩසටහන් නැරඹීම සඳහා ඈ වේලාසනින් රාත්‍රී ආහාරය ගනී.
C - නව පන්නයේ වේග රිද්ම සංගීතය වඩාත් ආකර්ෂණීය බව ඇයගේ මතය යි.
ග්‍රාහකයෙකු වශයෙන් මීනා පෙන්නුම් කරන මාධ්‍ය බලපෑම් ලක්ෂණ පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) චර්යාමය වෙනස, දෛනික න්‍යාය පත්‍රය සැකසීම, ආකල්පමය වෙනස
(2) දෛනික න්‍යාය පත්‍රය සැකසීම, ආකල්පමය වෙනස, චර්යාමය වෙනස
(3) ආකල්පමය වෙනස, චර්යාමය වෙනස, දෛනික න්‍යාය පත්‍රය සැකසීම
(4) චර්යාමය වෙනස, ආකල්පමය වෙනස, දෛනික න්‍යාය පත්‍රය සැකසීම

* *

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2019
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019

| විෂයය අංකය<br>பாட இலக்கம் | **87** | විෂයය<br>பாடம் | **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 4 | 21. | 4 | 31. | 2 |
| 02. | 2 | 12. | 2 | 22. | 1 | 32. | 2 |
| 03. | 1 | 13. | 4 | 23. | 2 | 33. | 4 |
| 04. | 4 | 14. | 1 | 24. | 2 | 34. | 4 |
| 05. | 4 | 15. | 4 | 25. | 4 | 35. | 3 |
| 06. | 2 | 16. | 2 | 26. | 2 | 36. | 2 |
| 07. | 4 | 17. | 2 | 27. | 1 | 37. | 3 |
| 08. | 2 | 18. | 4 | 28. | 3 | 38. | 3 |
| 09. | 3 | 19. | 1 | 29. | 4 | 39. | 1 |
| 10. | 4 | 20. | 1 | 30. | 1 | 40. | 1 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | **25 / 40** | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள் | **25 / 40** |
|---|---|---|---|

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## II පත්‍රය

1. "ගුවනින් ගමනක් යන්න ලැබුණොත්" මැයෙන් නීලා ලියූ රචනාව 'ඉදිරිය' ළමා පුවත්පතෙහි පළව ඇති බව විදුහල්පතිතුමා උදෑසන රැස්වීමේ දී සතුටින් ප්‍රකාශ කළේ ය.

   (i) ඉහත තේමාවට අනුව රචනාව ලිවීමට නීලාට උදව් වී ඇත්තේ කුමන සන්නිවේදන වර්ගය ද?

   (ii) 'රචනාව' අයත් වන ප්‍රධාන සන්නිවේදන ස්වරූපය කුමක් ද?

   (iii) පුවත්පත අයත් වන සන්නිවේදන වර්ගයට අදාළ තවත් වාරානුකූල ව ප්‍රකාශයට පත් වන මාධ්‍යයක් නම් කරන්න.

   (iv) විදුහල්පතිතුමා සම්බන්ධ වන සන්නිවේදන වර්ගය කුමක් ද?

   (v) 'තේමාව' හැඳින්වීමට පුවත්පත් වාර්තාවක දී භාවිත කරනු ලබන යෙදුම කවරේ ද?

   (vi) පුවත්පතක අන්තර්ගතය විවිධ ආකෘති අනුව ඉදිරිපත් කෙරේ. ඉහත ලිපිය අයත් වන්නේ ඉන් කුමන ආකෘතියට ද?

   (vii) ඉහත ලිපිය පළ කරන ලද්දේ ලංකා රජයට හිමි පුවත්පතක නම් ඒ ආයතනය කුමක් විය හැකි ද?

   (viii) මෙම ලිපිය ඇසුරෙන් ඉදිරියේ දී ගුවන් විදුලි වැඩසටහනක් නිර්මාණය කිරීමට නීලා අදහස් කරයි. එහි දී ඇයට භාවිතයට ගත හැකි ශබ්ද ප්‍රයෝග **දෙකක්** යෝජනා කරන්න.

   (ix) පන්තිකාමරවල ප්‍රදර්ශනය කිරීම සඳහා නීලාගේ පුවත්පත් ලිපිය ඡායා පිටපත් කොට ගුරු මණ්ඩලය වෙත බෙදා දෙන ලදී. මේ සඳහා ඔවුන්ට භාවිත කළ හැකි ප්‍රක්ෂේපනීය **නොවන** මාධ්‍ය උපකරණ **දෙකක්** නම් කරන්න.

   (x) මාධ්‍ය භාවිතයේ දී නීලා සිය පරිකල්පනය අපූරු ලෙස භාවිත කරන බව විදුහල්පතිතුමා ප්‍රකාශ කර තිබුණි. 'පරිකල්පනය' යන්න සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 x 10)

(i) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

(ii) ලිඛිත ස්වරූපය

(iii) සඟරා

(iv) සමූහ සන්නිවේදනය / කණ්ඩායම් සන්නිවේදනය

(v) ශීර්ෂ පාඨය / සිරස්තලය

(vi) විශේෂාංග

(vii) සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක්හවුස් ආයතනය / ANCL)

(viii) හඬ, නිහඬ බව, සංගීතය, ශබ්ද

(ix) පත්‍රිකා ලෑල්ල, චුම්බක පුවරුව

(x) චිත්තරූප මැවීමේ හැකියාව

***(ලකුණු 2 x 10 = 20 යි)***

**2.** අමරා තම පාසල් මිතුරියක වන ලක්ෂ්මීට දුරකථනයෙන් කථා කොට තමාට මඟහැරුණු ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක සහිත පාඩමක් පිළිබඳ කරුණු විමසා සිටියා ය.

(i) ගුවන්විදුලි දුරකථන සංවාද වැඩසටහන් ආකෘතියේ විශේෂතා **දෙකක්** නම් කරන්න.

1. එසැනින් සම්බන්ධ වීමේ හැකියාව (සජීවී)
2. රටේ ඕනෑම තැනක සිට සම්බන්ධ වීමේ හැකියාව
3. වැඩි පිරිසකට සම්බන්ධ වීමේ අවස්ථාව ලැබීම
4. සක්‍රීයව සම්බන්ධ වීමේ හැකියාව

***(ලකුණු ½ x 2 = 01 යි)***

(ii) ද්විපුද්ගල සන්නිවේදනයේ අවශ්‍යතාව පිළිබඳව කරුණු **දෙකක්** ඔස්සේ පැහැදිලි කරන්න.

1. ආදරය, කරුණාව හුවමාරු කර ගැනීමට
2. සමාජශීලී වීමට
3. කාර්යයන් නිම කර ගැනීමට
4. අදහස් හා තොරතුරු හුවමාරු කර ගැනීමට
5. ඉගෙනීමට හා ඉගැන්වීමට
6. පෙළඹවීමට
7. මානසික පීඩා සමනයට
8. ගැටුම් නිරාකරණයට
9. බලවත් ආවේග පිටකර ගැනීමට
10. සතුට අත්පත් කර ගැනීමට

***(ලකුණු 1 x 2 = 02 යි)***

(iii) දුරකථනය ඔස්සේ සම්බන්ධ වන දෙපාර්ශ්වය විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම **තුනක්** විස්තර කරන්න.

1. ඇමතුම සක්‍රීය වූ විගස ඇමතුම ලබාගන්නා තැනැත්තා තම අනන්‍යතාව හෙළි කිරීම
2. දෙපාර්ශවයේම ගෞරවය රැකෙන පරිදි වචන භාවිතය
3. අන් අය රැවටීම සඳහා භාවිත නොකිරීම
4. අන් අයට බාධා වන පරිදි භාවිත නොකිරීම
5. අදාළ පණිවිඩය කෙටියෙන් ප්‍රකාශ කිරීම
6. නාඳුනන ඇමතුම් හෝ කෙටි පණිවිඩවලට අනවශ්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීමෙන් වැලකීම
7. පණිවිඩය ලබන්නාට පැහැදිලිව තේරුම් ගත හැකි ආකාරයට ඉදිරිපත් කිරීම
8. තමන්ට අදාළ නොවන දුරකථන ඇමතුමක් නම් ආචාරශීලීව නොපමාව දැනුම් දී විසන්ධි කිරීම
9. පොදු ස්ථානවල දුරකතථය ක්‍රියාවිරහිත කර හෝ හඬ නිහඬ (Silent Mode) කර තැබීම

***(කෙටියෙන් විස්තර කර ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු ප්‍රදානය කරන්න.***

***(ලකුණු 1 x 3 = 03 යි)***

(iv) පාඩමට අදාළ තොරතුරු ලබා දීම සඳහා ලක්ෂ්මී විද්‍යුත් තැපැල භාවිත කළේ නම් ලබා ගත හැකි වාසි **හතරක්** පිළිබඳ විස්තර කරන්න.

1. ක්ෂණිකව තොරතුරු ලබා ගැනීමට හා ලබා දීම
2. එකවර විශාල පිරිසකට තොරතුරු ලබා දීම
3. ශ්‍රව්‍ය, දෘශ්‍ය, ශ්‍රව්‍ය - දෘශ්‍ය ආදී විවිධාකාරයේ තොරතුරු ලබාදිය හැකි වීම (Audio, Video, Photo)
4. එක් පුද්ගලයකුගේ හෝ කාර්යාලයීය නමකින් ලබාගත හැකි වීම
5. තොරතුරු බාගත කර තබාගත හැකි වීම (download)
6. රහස්‍යභාවය ආරක්ෂා කරගත හැකි වීම
7. ලබන්නාට ලිපිය කියවන තෙක් ලිපිය රඳවා තබා ගැනීමේ හැකියාව
8. සාපේක්ෂව මිල අඩු වීම
9. ලැබෙන ලිපි හා යවනු ලබන ලිපි අනුපිළිවෙලින් ගබඩාවී තිබීම

***(ලකුණු 1 x 4 = 04 යි)***

**3.** ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්හි ආකෘතිය හා අන්තර්ගතය විවිධාකාර ය.

(i) රූපවාහිනී ටෙලි නාට්‍ය තුළ ස්ත්‍රිය හා පුරුෂයා නිරූපණය වන ආකාරය අධ්‍යයනය සඳහා වැදගත් වන සංකල්පය කුමක් ද?

ස්ත්‍රී පුරුෂ සමාජභාවය *(ලකුණු 01 යි)*

(ii) කොටස් මත පදනම් ව රූපවාහිනී ටෙලි නාට්‍ය වර්ග කළ හැකි ආකාර **දෙකක්** විස්තර කරන්න.

1. ඒකාංගික ටෙලි නාට්‍ය
2. ප්‍රාසංගික ටෙලි නාට්‍ය
3. විවිධාංගික ටෙලි නාට්‍ය
4. මෙගා ටෙලි නාට්‍ය

***(ලකුණු 1 x 2 = 02 යි)***

(iii) ගුවන්විදුලිය සඳහා පිටපත් රචනා කිරීමේ දී සපුරාලිය යුතු කොන්දේසි **තුනක්** විස්තර කරන්න.

1. පිටපත් රචකයා වැඩසටහන පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාගත යුතුය.
2. වැඩසටහන් සැලැස්ම හඳුනාගැනීම හා පෙර සූදානමක් තිබිය යුතුය.
3. කාටද? කුමන වේලාවකට ද? මොනවාද? ඇයි? කුමන කරුණක් ද? කා සඳහා ද? යන්න පිළිබඳව මෙහි දී අවධානය යොමු කළ යුතුය.
4. පොදුවේ තමා ලියන වැඩසටහනෙහි ශ්‍රාවකයා හඳුනාගැනීම, ශ්‍රාවකයාගේ ආර්ථික, සමාජීය, රසවින්දන මට්ටම ආදිය පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය.
5. පිටපත් රචනය සඳහා මනා පෙර සූදානම, වැඩසටහන් පරමාර්ථ, වැඩසටහන ඉදිරිපත් කරන මාදිලිය, ඒ සඳහා භාවිත කරන ආකෘතිය, තම ග්‍රාහක කණ්ඩායම, ඉදිරිපත් කරන ගුවන්කාලය යනාදිය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.
6. භාෂාවේ ස්වරූපය - ලේඛන ව්‍යවහාරය නොව කථන ව්‍යවහාරයකි.
7. භාෂාවේ ආමන්ත්‍රණ ස්වරූපය - පුද්ගලික ඇමතුමක් හෝ මිත්‍රශීලි ආමන්ත්‍රණ ස්වරූපයක් ගනී.
8. ශ්‍රවණ ස්වරූපය - ඇසෙන්නේ එකවරක් පමණක් බැවින් මුල් අවස්ථාවේදීම අසන්නාට තේරුම් යා යුතුය.
9. ශබ්ද ස්වරූපය - යොදාගන්නේ ශබ්ද පමණක් බැවින් ශබ්දය මගින් සියලු දේ මනසේ චිත්‍රණය විය යුතුය.
10. පිටපතෙහි තාක්ෂණික උපදෙස් ඇතුළත් කර තිබීම.

***(ලකුණු 1 x 3 = 03 යි)***

(iv) නූතන රූපවාහිනී වෙළෙඳ ප්‍රචාරණයේ බලපෑම පිළිබඳ පහත සඳහන් කරුණු ඇසුරෙන් සාකච්ඡා කරන්න.
A - භාණ්ඩ හා සේවා පිළිබඳ දැනුවත් කිරීම
B - ව්‍යාපාරික අනුග්‍රාහකත්වය මත යැපීම
C - මහා පරිමාණ වෙළෙඳ ප්‍රචාරණය හා නව පාරිභෝගික සංස්කෘතිය
D - විචාරශීලී ග්‍රාහකත්වයේ වැදගත්කම

A. භාණ්ඩ හා සේවා පිළිබඳ දැනුවත් කිරීම

නව නිෂ්පාදන හා සේවාවන් පිළිබඳ පාරිභෝගිකයන් දැනුවත් වීම හා පොළඹවාලීම වෙළෙඳ දැන්වීම්කරණය යි. පාරිභෝගිකයාට භාණ්ඩ හා සේවා සංසන්දනය කර තෝරාගැනීමට ඇති හැකියාව, මිල ගණන් සහ එහි ප්‍රමිතීන් හඳුනාගැනීම, මිල දී ගත හැකි ස්ථාන හඳුනාගැනීම ආදී අවස්ථා උදා වේ.

B. ව්‍යාපාරික අනුග්‍රාහකත්වය මත යැපීම

රූපවාහිනී නාලිකා වැඩි ප්‍රමාණයක් නඩත්තු වන්නේ ව්‍යාපාරික ආයතනවල අනුග්‍රහයෙනි. පාරිභෝගිකයා පොළඹවාලීමට මාධ්‍ය ආයතන දැඩි තරගකාරිත්වයක් මත ක්‍රියා කරයි.

රූපවාහිනී මාධ්‍ය අන්තර්ගතය කෙරෙහි ධනාත්මක මෙන්ම ඍණාත්මක ලෙස ද අනුග්‍රාහකත්වය මගින් බලපෑම් කරනු ලබන බැවින් ගුණාත්මක වැඩසටහන් සඳහා පවතින ඉඩප්‍රස්ථාවන් අවම විය හැකිය.

C. මහා පරිමාණ වෙළෙඳ ප්‍රචාරණය සහ නව පාරිභෝගික සංස්කෘතිය

මහා පරිමාණ වෙළෙඳ ප්‍රචාරණයේ බලපෑමෙන් මිදීමට රූපවාහිනී ප්‍රේක්ෂකයාට අසීරු වී ඇත. ප්‍රේක්ෂකයාගේ දෛනික න්‍යායපත්‍රය රූපවාහිනී මාධ්‍ය මත සකස් කරගැනීම, ආකල්පමය සහ චර්යාත්මක අයුරින් පැහැදිලි වෙනස්කම්වලට භාජනය වීම ආදි ලක්ෂණ හඳුනාගත හැකිය. කෘත්‍රිම අවශ්‍යතා පාරිභෝගිකයා තුළ ගොඩනැගීම ද වෙළෙඳ ප්‍රචාරණයේ ප්‍රතිඵලයකි.

D. විචාරශීලී ග්‍රාහකත්වයේ වැදගත්කම

විචාරශීලී වීම තුළින් රූපවාහිනී වෙළෙඳ ප්‍රචාරණයෙන් සිදුවන අයහපත් බලපෑම අවම කරගත හැකිය. දැන්වීම් ප්‍රචාරණය තුළින් ග්‍රාහකයා පොළඹවා ගැනීමට යොදන උපාය මාර්ග හඳුනාගැනීම හා තමාට අවැසි දේ තෝරාගැනීමට ඇති හැකියාව මෙමගින් ලැබේ.

***(ලකුණු 4 x 1 = 04 යි)***

**4.** සන්නිවේදනය තොරතුරු 'ගනුදෙනුවක්' ලෙස හඳුන්වයි.

(i) නූතන තොරතුරු ගනුදෙනුවල දී භාවිත විද්‍යුත් පුවත්පත්වල පොදු ලක්ෂණ **දෙකක්** දක්වන්න.

1. ක්ෂණිකව පුවත් දැනගැනීමේ හැකියාව
2. ගබඩා කර තබාගැනීමේ පහසුව
3. නැවත නැවත කියවිය හැකි වීම
4. තොරතුරු විෂයන් අනුව වර්ග කරමින් පළකොට තිබීම
5. යාවත්කාලීන කිරීමේ පහසුකම් වැඩි වීම
6. පාඨක ප්‍රතිචාර ලැබීම වේගවත් වීම
7. අදාළ වෙනත් මූලාශ්‍ර හා සබැඳීමේ හැකියාව (Hyperlinks)

***(ලකුණු ½ x 2 = 01 යි)***

(ii) තම ව්‍යාපාරික ස්ථානය සඳහා සංවෘත පරිපථ රූපවාහිනී කැමරා භාවිත කිරීමට හිමිකරු අදහස් කරයි. මෙමගින් ලැබෙන වාසි **දෙකක්** විස්තර කරන්න.

1. සේවකයින් පිළිබඳ නිසි අධීක්ෂණයක් කළ හැකි වීම
2. ආයතනය තුළ සොරකම්, වංචා ආදිය සිදුවීමට ඇති අවස්ථා අවම වීම
3. වංචාවක් හෝ සොරකමක් සිදු වූ අවස්ථාවක එය නිසි පරිදි හඳුනාගත හැකි වීම
4. එක් ස්ථානයක සිට විවිධ ස්ථානවල තොරතුරු නිරීක්ෂණය කිරීමේ හැකියාව
5. ගබඩා වී ඇති තොරතුරු පසු අවස්ථාවන්හි දී නැවත නිරීක්ෂණය කළ හැකි වීම
6. තොරතුරු මූලාශ්‍රයක් ලෙස භාවිත කළ හැකි වීම

***(ලකුණු 1 x 2 = 02 යි)***

(iii) ජන මාධ්‍යයෙන් ඉදිරිපත් කරන තොරතුරු ළමයාගේ සමාජ ජීවිතය කෙරෙහි කරනු ලබන බලපෑම පිළිබඳ කරුණු **තුනක්** යටතේ විස්තර කරන්න.

1. සම්මත භාෂා භාවිතය වෙනස් වීම
2. අවරගනයේ රසවින්දනයට හුරු වීම
3. මාධ්‍ය වැඩසටහන්වලින් නිරූපණය කරන චරිත ළමුන්ගේ වීරයන් බවට පත් වීම
4. අපගේ සමාජ සංස්කෘතියට නොගැලපෙන විලාසිතාවලට යොමු වීම
5. ප්‍රචණ්ඩකාරී තොරතුරු නිතර ඉදිරිපත් කිරීමෙන් ළමයා ප්‍රචණ්ඩත්වයට නැඹුරු වීම
6. ඵලදායි නොවන හුරුපුරුදුවලට යොමු වීම මගින් කාලය හා ධනය නිකරුණේ වැය කිරීම
7. හරසුන් අපේක්ෂා පසුපස හඹායාමට පෙළඹීම
8. සමාජ සම්බන්ධතා සීමා වීම
9. හුදෙකලා බවට පත් වීම
10. පරිභෝජන රටාව කෙරෙහි අහිතකර ලෙස බලපෑම

***(ලකුණු 1 x 3 = 03 යි)***

(iv) පහත කරුණු අතුරෙන් **දෙකක්** තොරතුරු වාර්තා කිරීමේ දී වැදගත් වන ආකාරය විස්තර කරන්න.
(a) නිවැරදි බව
(b) සමතුලිත බව
(c) පැහැදිලි බව
(d) විශ්වසනීයත්වය

(a) නිවැරදි බව

තොරතුරු වාර්තා කිරීමේදී වැදගත්ම ගුණාංගය ලෙස නිවැරදි බව යන්න සැලකිය හැකිය. තොරතුරකට අදාළ සෑම කරුණක්ම සත්‍ය විය යුතුය. එමෙන්ම එම තොරතුර නැවත සනාථ කරගැනීමට හැකි විය යුතුය. මෙහි දී අදාළ සිදුවීම්, පුද්ගල නම්, ස්ථාන, වෘත්තීන්, දින ආදිය නිවැරදි වීම ඉතා වැදගත් වේ.

(b) සමතුලිත බව

සමතුලිත බව යන්නෙහි මූලික අදහස අපක්ෂපාතී වීමයි. එනම් පුද්ගලික ළැදියාව, වාසි, අභිමතාර්ථ, ආදියෙන් තොරව සියලු පාර්ශව නියෝජනය කරමින් තොරතුරු සමබරව ඉදිරිපත් කිරීම කළ යුතුය. තොරතුරුවල වටිනාකම ඉහළ නැංවීමට එය හේතු වේ. සිදුවීමට අදාළ සියලුම පාර්ශවයන්හි තොරතුරු සමබරව ඉදිරිපත් කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

(c) පැහැදිලි බව

තොරතුරුවල පැහැදිලි බව ආරක්ෂා වීමට සරල හා නිරවුල් භාෂාවක් භාවිත කිරීම. වචන අවම වශයෙන් භාවිත කිරීම ආදිය වැදගත් වෙයි. සංකීර්ණ භාෂා රටා, වැරදි උච්චාරණ හෝ අපැහැදිලි රූපමය දර්ශනවලින් තොර වීම ද පැහැදිලි බවට හේතු වෙයි. ඕනෑම අයෙකුට පහසුවෙන් අවබෝධ කරගත හැකි වදන් මාලාවන් යොදා ගැනීම මගින් පැහැදිලි බව ආරක්ෂා වේ.

(D) විශ්වසනීයත්වය

නිවැරදි බව, පැහැදිලි බව, සමතුලිත බව එක්වීමෙන් අදාළ තොරතුරු කෙරෙහි විශ්වසනීයත්වය ගොඩ නැගේ. ඉන් එක් අංශයක් හෝ බිඳවැටීමෙන් විශ්වසනීයත්වය සීමා විය හැකි ය.

***(ලකුණු 2 x 2 = 04 යි)***

**5.** (i) මෘදු පුවත් යනු මොනවා ද?

මෘදු පුවත් යනු, (Soft News)

සමාජයට වැඩි බලපෑමක් ඇති නොකරන එහෙත් වැඩි දෙනාගේ අවධානය හා කැමැත්ත දිනාගන්නා, මානව හැඟීම්වලට ආමන්ත්‍රණය කරන පුවත් වේ. මෙහි දී යොදාගන්නා භාෂාව නිර්මාණශීලී වන අතර මෙම ස්වභාවයේ පුවත් කියවීමෙන් ග්‍රාහකයා සතුටක්, වින්දනයක් ලබයි. වෛරය, ක්‍රෝධය වැනි හැඟීම් උද්දීපනය කරන පුවත් ද මෙයට අයත් වෙයි.

***(ලකුණු 01 යි)***

(ii) රාජ්‍ය මාධ්‍ය ආයතනයක් වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ කළමනාකරණය පිළිබඳ තීරණ ගැනීමට සම්බන්ධ වන පාර්ශ්ව **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.

1. සභාපති
2. අධ්‍යක්ෂ මණ්ඩලය
3. ප්‍රධාන විධායක

- සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන්නේ රජය විසින් හෝ විෂය භාර අමාත්‍යවරයා විසිනි. ආයතනයේ ප්‍රධානියා සභාපතිවරයා වන අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතුරින් අයෙකු සභාපති ධුරයට පත්කරනු ලබයි. රජය විසින් මෙම සාමාජිකයන් පත්කරන බැවින් රජයේ ඍජු පාලනයට යටත් වීමට ඔවුනට සිදු වේ.
- සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන අතර ජන මාධ්‍ය ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාට ඒවා ක්‍රියාත්මක කිරීමට වගකීම පැවරේ.
- අවශ්‍ය අවස්ථාවල දී ඒ ඒ විෂයන්ට පත්කර ඇති අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ අදහස් විමසා බලා සභාපතිවරයා තීන්දු තීරණ ගනු ලැබේ.

***(ලකුණු 1 x 2 = 02 යි)***

(iii) රාජ්‍ය මාධ්‍ය ආයතන ප්‍රධානියෙකුට සිය රාජකාරි කටයුතුවල දී තොරතුරු වැදගත් වන අවස්ථා **තුනක්** විස්තර කරන්න.

1. ආයතනික තීරණ ගැනීමේ දී
2. ආයතනික ගැටලු නිරාකරණය කිරීමේ දී
3. ආයතන හා සම්බන්ධ නිර්මාණාත්මක කටයුතුවල දී
4. තම ආයතනය තුළ සේවය කරන සේවකයින් සමග අවබෝධයකින් ක්‍රියාකිරීමේ දී
5. සියලු ආයතන හා සමාජ කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වා ගැනීමේ දී

*(ලකුණු 1 x 3 = 03 යි)*

(iv) ජනමාධ්‍ය, සමාජය කෙරෙහි ධනාත්මක ව හා ඍණාත්මක ව බලපෑම් කරන ආකාරය පිළිබඳ පහත සඳහන් අවස්ථා ඇසුරින් වෙන වෙනම පැහැදිලි කරන්න.
A - පරිභෝජන රටාව
B - රස වින්දනය

| ධනාත්මක බලපෑම | ඍණාත්මක බලපෑම |
|---|---|
| **A පරිභෝජන රටාව**<br>• නිවැරදි පෝෂණ රටාවකට හුරු වීම.<br>• විකල්ප අවස්ථා තෝරාගැනීමේ හැකියාව.<br>• වෙළෙඳපොලට නව නිෂ්පාදන වර්ග හඳුන්වා දීම. | • අධි පරිභෝජන රටාවකට හුරු වීම.<br>• ක්ෂණික ආහාරවලට යොමු වීම.<br>• සංස්කෘතියට නොගැලපෙන විලාසිතාවන්ට හුරු වීම.<br>• කෘතිම අවශ්‍යතාවලට යොමු වීම.<br>• භාණ්ඩ හා සේවා පිළිබඳ පාරිභෝගිකයා තුළ වැරදි අවබෝධයක් ගොඩ නැගීම. |
| **B රස වින්දනය**<br>• උසස් රස වින්දනයට යොමු වීම.<br>• දීර්ඝ කාලීන සහෘදයන් බවට පත් වීම.<br>• වෙනත් රටවල නිෂ්පාදනය වූ නිර්මාණ රස විඳීමෙන් අන්තර් සංස්කෘතින් පිළිබඳ අවබෝධය පුළුල් වීම. | • ලිංගිකත්වය ඉස්මතු වීම.<br>• ප්‍රචණ්ඩත්වය ඉස්මතු වීම.<br>• අවරගනයේ රස වින්දනයට නැඹුරු වීම. |

*(ලකුණු 2 x 2 = 04 යි)*

**6.** ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන ප්‍රභා පසුගිය ජනාධිපතිවරණයේ දී තමන්ගේ කුළුදුල් ඡන්දය භාවිත කරන ලදී.
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු සතු ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

1. නිශ්චිත දේශසීමාවක් තුළ ජීවත් වීම.
2. ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත් වීම.
3. ඡන්ද අයිතිය පාවිච්චි කිරීම.
4. බදු ගෙවීම.
5. නීතිගරුක වීම.
6. සමාජ ශුභසාධනයට කටයුතු කිරීම.
7. දේශාභිමානීව කටයුතු කිරීම.
8. සියලු ආගම්වලට හා සියලු ජාතීන්ට ගරු කිරීම.
9. යහපත් ලෙස වෘත්තියක නියැලීම.
10. ආචාරශීලී වීම හා ගුණගරුක වීම.
11. පවුල තුළ යහපත්ව ජීවත් වීම. ***(ලකුණු ½ x 2 = 01 යි)***

(ii) ජනාධිපතිවරණයක දී ප්‍රචාරණය සඳහා භාවිත කිරීමට සුදුසු රූපවාහිනී වැඩසටහන් ප්‍රභේද **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.

1. ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන්

ක්ෂණිකව ග්‍රාහකයාට තොරතුරු ලබා දෙයි. ඇතැම් ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් විවිධ අනුකොටස් ගණනාවකින් යුක්ත වේ.

ප්‍රවෘත්ති වැඩසටහන් සජීවී ආකාරයෙන් ඉදිරිපත් කරන අතර අවශ්‍ය දර්ශන පමණක් කලින් සකස්කර තබා ගනු ලබයි.

ප්‍රවෘත්ති, සම්මුඛ සාකච්ඡා, ගවේෂණාත්මක ප්‍රවෘත්ති, ප්‍රවෘත්ති විවේචන හා විශ්ලේෂණ ඇතුළත් වේ.

2. වාර්තා වැඩසටහන්

වාර්තා වැඩසටහන් ප්‍රවෘත්ති වැඩසටහනක මෙන් තොරතුරුමය ගුණයෙන් ද, සෞන්දර්යාත්මක ගුණයෙන් ද සමන්විත විය යුතුය. (සිනමා කෘතියක හෝ ටෙලි නාට්‍යයක මෙන් ආඛ්‍යානමය ලක්ෂණ සහිතව සකස් විය හැකිය.)

පසුබිම් කථන, සම්මුඛ සාකච්ඡා හෝ නාට්‍යමය ජවනිකා සහිතව විවිධ සෞන්දර්යාත්මක ප්‍රවේශයෙන්ගෙන් ඉදිරිපත් කළ හැකිය. ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් මෙන් ම දේශපාලන, චරිතාපදාන ආදී විවිධ ප්‍රවේශ භාවිත කළ හැකිය.

වාර්තා වැඩසටහන ප්‍රවෘත්ති වැඩසටහනකට වඩා වැඩි කාලයක් යොදා ගනිමින් නිර්මාණය කරනු ලබයි.

3. සංවාද හා සාකච්ඡා වැඩසටහන්

සාකච්ඡාවක් යනු කිසියම් ප්‍රස්තුතයක් ඔස්සේ පුද්ගලයින් කිහිප දෙනෙකු විසින් අදහස් හුවමාරු කරගැනීමයි. සංවාද වැඩසටහන් බොහෝ දුරට සාකච්ඡා වැඩසටහනකට සමාන වුව ද ඒවා අතර සුළු වෙනස්කම් තිබේ.

සංවාදයක පිළිගත් සම්ප්‍රදාය වන්නේ අදාළ කරුණ ඔස්සේ දෙදෙනාම හෝ දෙපාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කිරීමයි. මෙහෙයවන්නකුගේ සහභාගිත්වය අත්‍යවශ්‍ය වේ. මෙහි දී විවිධ අදහස් මතුකර ගැනීමට, ගැටලු නිරාකරණයට, විවිධ මතවාද බිඳීම හා තහවුරු කරගැනීමට, ප්‍රතිපත්ති හා ඉදිරි කාර්යයන් ඉදිරිපත් කිරීමට හැකි වේ.

4. සජීවී වැඩසටහන්

කිසියම් සිදුවීමක් පිළිබඳව එම මොහොතේම කෙරෙන විස්තර ප්‍රචාරයක් මින් අදහස් කෙරේ. උදාහරණයක් ලෙස දේශපාලන රැස්වීමක් හෝ දේශපාලනඥයින් සහභාගි වන අවස්ථාවල විස්තර ප්‍රචාරය මගින් ප්‍රේක්ෂකයාට අදාළ සිද්ධිය සජීවීව ඉදිරිපත් කළ හැකිය.

5. විවාද වැඩසටහන්

දෙපාර්ශවය හෝ පාර්ශව කිහිපයක් නිශ්චිත තේමාවකට අනුව තර්කානුකූලව කරුණු ඉදිරිපත් කිරීම මෙහි දී සිදු වේ. නිශ්චිත කාලයක්, නිශ්චිත අවස්ථා ආදී පොදුවේ විවාදයක දී භාවිත කරන ක්‍රමවේද මෙහි දී භාවිත වේ.

***(ලකුණු 1 x 2 = 02 යි)***

(iii) මැතිවරණ වේදිකාවක අපේක්ෂකයකු සිදු කරන කතාවක් ආවරණය කිරීමේ දී අංකිත හෙවත් ඩිජිටල් ඡායාරූපකරණය වඩා උචිත ය. එයට හේතු **තුනක්** විස්තර කරන්න.

1. ඉහළ ආලෝක සංවේදීතාවක් දක්වන නිසා අඩු ආලෝක තත්ත්වයක් යටතේ වුව ද ඡායාරූප ගැනීමට හැකි වීම.
2. මූලික වශයෙන් උපකරණ මිල දී ගැනීමට වැඩි මුදලක් වැය කිරීමට සිදුවන නමුත් සේයාපටල මිල දී ගැනීමට සිදු නොවීමත් අනවශ්‍ය ඡායාරූප මකා දැමීමට හැකි වීමත් නිසා භාවිතයේ දී ලාභදායි වීම.
3. ලබාගත් ඡායාරූප ඒ අවස්ථාවේදීම නැරඹිය හැකි වීම.
4. රසායනික ඡායාරූපකරණයේ දී මෙන් පැසුරුම්කරණය සඳහා කාලය ගත නොවන බැවින් ඉහළ කාර්යක්ෂමතාවකින් යුක්ත වීම.
5. අනවශ්‍ය ඡායාරූප මකා දැමිය හැකි නිසා මතක කාඩ්පතේ ධාරිතාව ඵලදායී අයුරින් යොදා ගත හැකි වීම.
6. පහසුවෙන් පරිගණකය හා සම්බන්ධ කළ හැකි නිසා කාර්යක්ෂමව සංස්කරණය කිරීමේ හැකියාව.
7. විද්‍යුත් තැපැල, අන්තර්ජාලය, ජංගම දුරකථන වැනි සන්නිවේදන ජාලයන්ට පහසුවෙන් යොමු කළ හැකි වීම.
8. අංකිත දත්ත ගොනු වශයෙන් ගබඩා කරන නිසා කාලාන්තරයකට පසුව වුව ද ඡායාරූපයේ ගුණාත්මකභාවය ආරක්ෂා වී පැවතීම.
9. වැඩිදියුණු කළ උපාංග සහිත බැවින් ආධුනිකයකුට වුවත් පහසුවෙන් මෙහෙයවීමේ හැකියාව පැවතීම.
10. පරිගණකය, ජංගම දුරකථන වැනි උපකරණවලට පවා එකතු කොට ඇති බැවින් ජීවිතයේ බොහෝ සන්නිවේදන අවස්ථාවලට පහසුවෙන් භාවිත කළ හැකි වීම.
11. අවශ්‍ය තරම් ඡායාරූප ලබාගත හැකි වීම.

***(ලකුණු 1 x 3 = 03 යි)***

| | |
|---|---|
| (iv) | මැතිවරණ කණ්ඩායම් රැස්වීම්වල දී භාවිත කිරීමට සුදුසු ප්‍රක්ෂේපණීය නොවන උපකරණ **හතරක** යෝග්‍යතාව පැහැදිලි කරන්න. |

- කළු ලෑල්ල, සුදු ලෑල්ල, කොළ ලෑල්ල
  සැමටම දර්ශනය වන ආකාරයට ස්ථානගත කිරීම.
  සුහදශීලී ආමන්ත්‍රණය, න්‍යාය පත්‍රය, පක්ෂ ලකුණ, අපේක්ෂක අංකය ආදිය ප්‍රදර්ශනය කිරීමට.
  ඡන්දය පාවිච්චි කළ යුතු ආකාරය ආදර්ශන ලෙස පෙන්වීම.
  කුඩා රැස්වීම් පැවැත්වෙන ස්ථානවල විවිධ ප්‍රමාණයෙන් සකස් කර ඇති සුදු සහ කොළ ලෑලි ජනප්‍රිය ලෙස භාවිත වීම.

- පිටු පෙරළනය (Flip Chart)
  මැතිවරණ කටයුතු පිළිබඳව දැනුවත් කිරීමට අවශ්‍ය කරුණු කලින් සටහන් කර තැබීමේ හැකියාව.
  අදාළ දෑ ඒ මොහොතේ ම පිටුවෙන් පිටුව ලියා පෙන්වීමේ හැකියාව.
  තාක්ෂණික දැනුමකින් තොරව භාවිත කිරීමේ හැකියාව.
  අවම පිරිවැයක් යටතේ ප්‍රාදේශීය මට්ටමෙන් මැතිවරණ රැළි සංවිධාන කරන අවස්ථාවල දී මෙවැනි උපකරණ ඵලදායී වීම.

- පත්‍රිකා ලෑල්ල / දැන්වීම් පුවරුව
  කලින් සකස් කරන ලද තොරතුරු පත්‍රිකා, පෝස්ටර් ආදිය ප්‍රදර්ශනය කරමින් සාකච්ඡා කිරීම.
  වැදගත් ඡායාරූප, ඡන්ද සලකුණු ආදිය ප්‍රදර්ශනය කිරීම.
  මැතිවරණ නීති රීති, ප්‍රතිපත්ති යනාදිය ප්‍රදර්ශනය කිරීම.

- කාන්දම් ලෑල්ල / චුම්බක පුවරුව
  මැතිවරණයට අදාළ පත්‍රිකා, ඡන්ද සලකුණු, අංක, නාමලේඛන, නීති රීති හා එයට අදාළ වෙනත් තොරතුරු කාන්දම් පුවරුවේ අවශ්‍ය පරිදි රටාවලට රැඳවීමේ හැකියාව.

***(ලකුණු 1 x 4 = 04 යි)***

**7.** (i) නිර්වාචික සන්නිවේදනය යනු කුමක් ද?

නිර්වාචික සන්නිවේදනය යනු,

වචන භාවිතයෙන් තොරව සිදු කරනු ලබන සන්නිවේදනය යි. එනම්, වාචික සන්නිවේදනය වඩාත් ශක්තිමත්ව සිදු කිරීමට අවාචික සන්නිවේදන විධික්‍රම භාවිත කරනු ලබයි.

උදා - ඉඟි, මුහුණේ ඉරියව්, අංග චලන, සංඥා, සංකේත, හඬ

***(ලකුණු 01 යි)***

(ii) නිර්වාචික ලෙස තොරතුරු ලබා දීමට ලිඛිත සන්නිවේදනයේ දී භාවිත කරන විධි ක්‍රම **දෙකක්** නම් කරන්න.

1. සංකේත
2. ඡායාරූප
3. අකුරුවල හැඩය
4. අකුරුවල ප්‍රමාණය
5. සිතියම්
6. ප්‍රස්ථාර
7. ලාංඡන
8. චිත්‍ර
9. වර්ණ
10. රූප සටහන්

***(ලකුණු 1 x 2 = 02 යි)***

(iii) ජනමාධ්‍යවල ඇතුළත් තොරතුරු විනිවිද දැකිය හැක්කේ විචාරශීලී ග්‍රාහකයකුට පමණි. එවැනි ග්‍රාහකයකු සතු ගුණාංග **තුනක්** පැහැදිලි කරන්න.

1. ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කරන දේ නිසි ලෙස අවබෝධ කරගැනීමේ හැකියාව.
2. මාධ්‍ය මගින් සඟවන දේ කුමක්දැයි අවබෝධ කරගැනීමේ හැකියාව.
3. ජන මාධ්‍ය කටයුතු කරන්නේ කුමන අරමුණකින් ද යන්න තේරුම් ගැනීමේ හැකියාව.
4. ජනමාධ්‍ය උත්සාහ දරන්නේ තමා කෙබඳු පුද්ගලයකු බවට පත්කිරීමට ද යන්න අවබෝධ කරගැනීමේ හැකියාව.
5. ග්‍රාහකයා පොළඹවා ගැනීමට මාධ්‍ය විසින් ගන්නා උපාය මාර්ග තේරුම් ගැනීමට ඇති හැකියාව.
6. මාධ්‍ය කුමක් ඉදිරිපත් කළ ද තමාට අවශ්‍ය දේ පමණක් තෝරා බේරාගැනීමට ඇති හැකියාව.
7. තම ප්‍රතිචාර පෞද්ගලිකව හා සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම මගින් මාධ්‍ය සමඟ අන්තර් සබඳතා පවත්වාගැනීමට ඇති හැකියාව.

***(ලකුණු 1 x 3 = 03 යි)***

(iv) තොරතුරු නිර්මාණාත්මක ව සන්නිවේදනය කිරීමේ දී යොදා ගන්නා පහත ප්‍රකාශන විධි නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.
(1) දෘශ්‍ය ප්‍රකාශන විධි
(2) ශ්‍රව්‍ය ප්‍රකාශන විධි

| දෘශ්‍ය ප්‍රකාශන විධි | ශ්‍රව්‍ය ප්‍රකාශන විධි |
|---|---|
| අකුරු | හූව, බෙර හඬ, නලා |
| අභිනය | කෘතිම හඬ |
| ඡායාරූප | නිහඬ බව |
| චිත්‍ර | සංගීතය |
| සංකේත | සත්ත්ව හඬ |
| සංඥා | ස්වභාවික ශබ්ද |
| වගු | සන්ටාර හඬ |
| ප්‍රස්තාර | |
| වර්ණ | |
| පිටු සැලසුම් | |

උදා - • ගමක් පිළිබඳව වාර්තාවක් සැකසීමේ දී ගමේ ඡායාරූප, සිතියම් ආදි සුදුසු දෘශ්‍ය ප්‍රකාශන විධි ඇතුළත් කොට සැකසීම.

• ජන කවි පිළිබඳව ශ්‍රව්‍ය මාධ්‍යයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමේ දී පරිසරයේ ස්වභාවික ශබ්ද, සත්ත්ව හඬ, සංගීතය, මිනිස් හඬ ආදි සුදුසු ශ්‍රව්‍ය ප්‍රකාශන විධි ප්‍රයෝජනයට ගැනීම.

***(ලකුණු 2 x 2 = 04 යි)***

## 87 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
## සංශෝධනය කරන ලද පිළිතුරු

**ප්‍රශ්න අංක 02**

(ii) **කොටස**

5. ~~ඉගෙනීමට හා ඉගැන්වීමට~~ පිළිතුර **අධ්‍යාපන කාර්ය සඳහා** ලෙස සංශෝධනය විය යුතුය.

(iii) **කොටස**

7. ~~පණිවිඩය ලබන්නාට පැහැදිලිව තේරුම් ගත හැකි ආකාරයට ඉදිරිපත් කිරීම.~~
9. පොදු ස්ථානවල **දුරකථනය** ක්‍රියාවිරහිත කර හෝ හඬ නිහඬ (Silent Mode) කර තැබීම.

(iv) **කොටස**

1. ~~ක්‍ෂණිකව තොරතුරු ලබා ගැනීමට හා ලබා දීම~~ පිළිතුර **ක්‍ෂණිකව තොරතුරු ලබා දීමට** ලෙස සංශෝධනය විය යුතුය.
2. ~~එකවර විශාල පිරිසකට තොරතුරු ලබා දීම~~
3. ~~එක් පුද්ගලයකුගේ හෝ කාර්යාලයීය නමකින් ලබාගත හැකි වීම~~

**ප්‍රශ්න අංක 04**

(iii) **කොටස**

1. ~~සම්මත භාෂා භාවිතය වෙනස් වීම~~ පිළිතුර **භාෂා භාවිතයේ වෙනස්කම් ඇති විය හැකි වීම** ලෙස සංශෝධනය විය යුතුය.
2. ~~අවරගනයේ රසවින්දනයට හුරු වීම~~ පිළිතුර **රස වින්දනයේ වෙනසක් ඇති විය හැකි වීම** ලෙස සංශෝධනය විය යුතුය.
4. ~~අපගේ සමාජ සංස්කෘතියට නොගැලපෙන විලාසිතාවලට යොමු වීම~~ පිළිතුර **විලාසිතාවල වෙනස්කම් ඇතිවීම** ලෙස සංශෝධනය විය යුතුය.
6. ~~ඵලදායි නොවන හුරුපුරුදුවලට යොමු වීම මගින් කාලය හා ධනය නිකරුණේ වැය කිරීම~~ පිළිතුර **ආකල්ප හා චර්යා රටාවන්ගේ විවිධ වෙනස්කම් ඇතිවීම** ලෙස සංශෝධනය විය යුතුය.
7. ~~හරසුන් අපේක්‍ෂා පසුපස හඹායාමට පෙළඹීම~~ පිළිතුර **කාලය හා ධනය නිකරුණේ වැය වීමට හැකි වීම** ලෙස සංශෝධනය විය යුතුය.
10. ~~පරිභෝජන රටාව කෙරෙහි අහිතකර ලෙස බලපෑම~~ පිළිතුර **පරිභෝජන රටාව කෙරෙහි බලපෑම් ඇතිවීම** ලෙස සංශෝධනය විය යුතුය.